MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

GEOGRAPHY

භූගෝල විද්‍යාව

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## භූගෝල විද්‍යාව - I

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

සැළකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.
- එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 යි.

* 1 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

1. උන්නතාංශය සමඟ උෂ්නත්වය ක්‍රමයෙන් පහළ බැසීම ........................ ගෝලයේ විශේෂ ලක්ෂණයකි.
   (පරිවර්ති/අපරිවර්ති/තාප)

2. පෘථිවියේ විශාලතම සාගරික භූ තැටිය වන්නේ ............................................ යි.
   (ඉන්දු-ඕස්ට්‍රේලියානු භූ තැටිය/අප්‍රිකානු භූ තැටිය/පැසිපික් භූ තැටිය )

3. කඳුකර ප්‍රදේශයක පිහිටි උස් සම භූමිය. ................................ නමින් හඳුන්වයි.
   ( සානුව/කපොල්ල/නිම්නය )

4. චර්නෝසම් පස වඩාත් යෝග්‍ය වන්නේ ............................. වගාව සඳහා ය
   (වී/පොල්/තිරිඟු)

5. බස්නාහිර පළාතේ පිහිටා ඇති වී පර්යේෂණායතනය .............................. වේ.
   ( බෝම්බුවල/අම්බලන්තොට/මහඉලුප්පල්ලම )

6. ජනසවිය, දිවිනැගුම වැනි සංවර්ධන ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ ............................. සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වේ.
   (පරිසර/ආර්ථික/මාර්ග)

7. ජිප්සම් පාෂාණ වර්ගය අයත් වන්නේ .......................... පාෂාණ වර්ගයට ය.
   (ආග්නේය/අවසාදිත/විපරිත)

8. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ දක්නට ලැබෙන පස් වර්ගය වන්නේ ............................ ය.
   (රතු කහ ලැටසෝල් පස/චූර්ණමය නොවූ දුඹුරු පස/රතු දුඹුරු ලැටසෝල්ස් පස )

9. ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව 2012 දී වාර්ෂික වර්ධන අනුපාතිකය ............................. කි.
   ( 1.2/0.7/1.7 )

10. 1: 50000 භූ ලක්ෂණ සිතියමක වර්ග ප්‍රමාණය $4cm^2$ කින් නිරූපිත සැබෑ භූමියේ විශාලත්වය..................... කි.
    (වර්ග කිලෝමීටර 4/වර්ග සෙන්ටිමීටර 1/වර්ග කිලෝමීටර 1 )

* **11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. භූමි කම්පා, සුනාමි, ගිනිකඳු, ආදි ස්වාභාවික උපද්‍රව දේශගුණික උපද්‍රව ලෙස සැලකේ. ( නි/වැ)

12. සාර්ක් රටවල් අතර ඉහළම මානුෂ සංවර්ධන දර්ශක අගයක් ඇත්තේ ශ්‍රී ලංකාවට යි. ( නි/වැ)

13. නොදිරූ පැළෑටි විශේෂ හා සත්ත්ව කොටස් ද අර්ධ වශයෙන් දිරාපත් වූ ද්‍රව්‍යවලින්ද B මහ සමන්විත වේ. ( නි/වැ)

14. ශ්‍රී ලංකාවේ 2012 සංඛ්‍යා දත්ත අනුව කෘෂි අංශයේ සේවා නියුක්තිය 26.1% කි. ( නි/වැ)

15. දේශගුණික වෙනස්කම් අවම කිරීම සඳහා 1992 රියෝ ද ජැනයිරෝ නුවර දී මිහිකත සමුළුව පැවැත්විණි. ( නි/වැ)

* **16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල ''අ''සහ ''ආ'' යනුවෙන් තීර දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

16. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන කිහිපයක් ''අ'' තීරයේ ද, ඒවායේ අපනයන ගම්මාන ''ආ'' තීරයේ ද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1 - කජු | A. රාජාංගනය |
| 2 - මිරිස් | B. කටුගම්පොල |
| 3 - බුලත් | C. පොළොන්නරුව |
| 4 - වී | D. දඹදෙණිය |

(1) ADBC (2) DABC (3) BDAC (4) DACB (..........)

17. ලෝකයේ විවිධ රටවල් කිහිපයක් ''අ'' තීරයේ ද, එම රටවල යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන කිහිපයක් ''ආ'' තීරයේ ද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1 - චීනය | A. ලැන්කැෂයර් |
| 2 - ජපානය | B. කුෂ්නෙට්ස්ක් |
| 3 - රුසියාව | C. නගෝයා |
| 4 - එක්සත් රාජධානිය | D. දකුණු මැන්චූරියා |

(1) CBDA (2) BDAC (3) DCAB (4) DCBA (.........)

18. ශ්‍රී ලංකා 1:50,000 සිතියම් පත්‍රයක අන්තර්ගත තොරතුරු කිහිපයක් ''අ'' තීරුවේ ද, ඒවා සිතියමේ දැක්වෙන ස්ථාන ''ආ'' තීරුවේ ද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| අ | ආ |
|---|---|
| 1. සිතියම් පත්‍රයේ නම | A - ඇතුළු මායිම් තීරුව |
| 2. භෞතික හා සංස්කෘතික ලක්ෂණ | B - වට තීරුවේ පහළ කොටස |
| 3. පරිමාණය | C - වට තීරුවේ ඉහළ කොටස |
| 4. ජාතික ඛණ්ඩාංක (මෙට්‍රික්) | D - සිතියම් මුහුණත |

(1) CDAB (2) CDBA (3) CABD (4) DCBA (..........)

19. ශ්‍රී ලංකාවේ වනාන්තර පද්ධතියට අයත් උප පද්ධති හතරක් ''අ'' තීරුවේ ද, එම වනාන්තරවල බහුලව වැවෙන ශාක වර්ග කිහිපයක් ''ආ'' තීරුවේ ද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| අ | ආ |
|---|---|
| 1. නිවර්තන තෙත් වනාන්තර | A - බුරුත, කළුවර, මිල්ල |
| 2. කඳුකර තෙත් කලාපීය වනාන්තර | B - මහරත්මල්, අරළු, බුළු |
| 3. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර | C - සපු, කීන, වල්දෙල් |
| 4. කඳුකර වියළි කලාපීය වනාන්තර | D - හොර, ගොඩපර, දවට |

(1) DCAB (2) ADBC (3) CDAB (4) BCDA (..........)

20. ලෝකයේ මහාද්වීප කිහිපයක නම් ''අ'' තීරුවේ ද, ගංගා කිහිපයක් ''ආ'' තීරුවේ ද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| අ | ආ |
|---|---|
| 1. ආසියාව | A - නයිජර් |
| 2. උතුරු ඇමරිකාව | B - යෙනිසි |
| 3. අප්‍රිකාව | C - ඩැනියුබ් |
| 4. යුරෝපය | D - මැකැන්සි |

(1) ABDC (2) ADBC (3) BDAC (4) BDCA (..........)

* **21 සිට 25 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21. උන්නතාංශය සමඟ උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ බසී. එය ...................................................... නමින් හැඳින්වේ.


22. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය ජල යෝජනා ක්‍රමය ලෙස ........................................... වේ .

23. උතුරු හා දකුණු අක්ෂාංශ $30^0$ සිට $50^0$ අතර ප්‍රදේශවල ව්‍යාප්තව ඇති වනාන්තර ...................................... වනාන්තර නමින් හැඳින්වේ.

24. රතු මුහුද හා මධ්‍යධරණී මුහුද සම්බන්ධ වනුයේ ............................. නාවික ඇළ මාර්ගයෙනි.

25. ශ්‍රී ලංකාවේ 1:50 000 භූ ලක්ෂණ සිතියමක විශාලත්වය වර්ග කිලෝමීටර............................. කි.

* **26 සිට 28 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදා ගන්න.**





26. ශ්‍රී ලංකාවේ කිරිගව සම්පත් භූවමාරු ආයතනයක් පිහිටා ඇති දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය ....................... ය.

27. සුළු අපනයන බෝග පර්යේෂණායතනය පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය ....................... ය.

28. ශ්‍රී ලංකාවේ පිත්තල කැටයම් සඳහා ප්‍රසිද්ධ දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය ....................... ය.

* **29 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ප්‍රස්තාරය යොදා ගන්න.**




29. අඩුම තිරිඟු නිෂ්පාදනයක් කරන රට ........................................................ යි.

30. කැනඩාව ආසන්න වශයෙන් ........................................................ පමණ නිෂ්පාදනයක් පෙන්වයි.

* 31 **සිට** 40 **දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

31. රටක ජන ඝනත්වය කෙරෙහි බලපෑමක් ඇති **නොකරන** සාධකය මින් කුමක්ද?

(1) යටිතල පහසුකම් (2) සේවා පහසුකම්

(3) සංක්‍රමණ (4) වයස් ව්‍යුහය (..........)

32. පෘථිවි කබොල හා ප්‍රාවරණය වෙන් කරනු ලබන සීමාව හඳුන්වනු ලබන්නේ?

(1) කොන්රඩ් අසන්තතියයි (2) මොහොරෝවිසික් අසන්තතිය යි

(3) ගුටෙන්බර්ග් අසන්තතිය යි (4) ලේමන් අසන්තතිය යි (..........)

33. ලෝකයේ නිෂ්පාදනය කරනු ලබන මෝටර් රථ අතුරින් වැඩිම නිෂ්පාදනයක් කරනු ලබන රටවල් යුගල වන්නේ මින් කුමක්ද ?

(1) ඇමරිකා එක්සත් ජනපදය, තායිවානය (2) චීනය, ජපානය

(3) ඉන්දුනීසියාව, ප්‍රංශය (4) සිංගප්පූරුව, ජපානය (..........)

34.

- මීටර 1200 ට ඉහළ උස්බිම්වල ව්‍යාප්තව ඇත.
- අපි ශාක බහුලය
- සමනල, පිදුරුතලාගල කඳුවල ව්‍යාප්තව ඇත.

ඉහත සාධක ඇතුළත් ශ්‍රී ලංකා වනාන්තර කලාපය වන්නේ,

(1) නිවර්තන තෙත් වනාන්තර (2) කඳුකර තෙත් කලාපීය වනාන්තර
(3) වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර (4) කඳුකර වියළි කලාපීය වනාන්තර (..........)

35. නිරායාසයෙන් ලබාගන්නා සම්පතක් **නොවන්නේ**

(1) වාතය (2) ඛනිජ සම්පත් (3) හිරු එළිය (4) ජලය (..........)

36. වර්ෂ 2012 ට අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව ජනාවාස අනුව නිවැරදි ලෙස වර්ග කර ඇති පිළිතුර තෝරන්න

(1) ග්‍රාමීය 60%, නාගරික 30%, වතු 10% (2) ග්‍රාමීය 77%, නාගරික 18%, වතු 04
(3) ග්‍රාමීය 77%, නාගරික 22%, වතු 01% (4) ග්‍රාමීය 18%, නාගරික 77%, වතු 05% (..........)

37. සංවර්ධන මිනුම් අතර සාම්ප්‍රදායික හා ආර්ථික මිනුමක් ලෙස සැලකිය හැක්කේ මින් කුමක්ද ?

(1) දළ ජාතික නිෂ්පාදනය (2) මානුෂ සංවර්ධන දර්ශක
(3) මානුෂ දරිද්‍රතා දර්ශකය (4) මානුෂ පීඩක දර්ශකය (..........)

38. හග්ගල, රිටිගල යන ස්වාභාවික රක්ෂිත

(1) ජාතික වනෝද්‍යාන වේ (2) දැඩි ස්වාභාවික රක්ෂිත වේ
(3) අභය භූමි වේ (4) වන රක්ෂිත වේ (..........)

39. ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම්වල භෞතික ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද ?

(1) දිය ඇල්ල (2) වෙරළ (3) වැව් (4) ගං මෝය (..........)

40. ජාත්‍යන්තර ජනගහන දිනය වන්නේ,

(1) ජුනි 05 (2) ජූලි 11 (3) ජූලි 18 (4) සැප්තැම්බර් 05 (..........)

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**GEOGRAPHY**

**භූගෝල විද්‍යාව**

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**භූගෝල විද්‍යාව - II**

**අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

සැළකිය යුතුයි

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටස ව්‍යුහගත රචනා ප්‍රශ්න 07කින් සමන්විත වේ. ඉන් 04කට පිළිතුරු සැපයිය යුතුවේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 40කි.

## I කොටස

1) (අ) **ඔබ වෙත සපයා ඇති 1 : 50000 සිතියම් කොටස අධ්‍යනය කොට ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) සිතියමේ අංක 01, 02, 03 හා 04 යන ලක්ෂණ පහත පිළිතුරු අතරින් තෝරා අංක අනුව නැවත ලියන්න.

(රැළි බිම/හේන/වනාන්තරය/පාෂාණ උද්ගතය/සෙසු මාර්ගය/ ජීප් රථ මාර්ගය) (ල.02)

(ii) A-B හා C-D ලෙස දක්වා ඇති භූ ලක්ෂණ පහත පිළිතුරු අතරින් තෝරා අක්ෂර අනුව නම් කරන්න.

( උත්තල බෑවුම/අවතල බෑවුම/දළ බෑවුම/මොහොර බෑවුම ) (ල.02)

(iii) මෙම සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන වතු බෝග වගාවක් නම් කරන්න. (ල.01)

(iv) සිතියමේ ඊසාන කෙළවරට සම්බන්ධ J, K, L, M ලෙස දක්වා ඇති සිතියම් කොටසේ වර්ගඵලය වර්ග කිලෝමීටර්වලින් සොයන්න. (ල.02)

(v) සිතියමේ x හා y යන ලක්ෂ දෙකෙහි නිවැරදි පිහිටීම අක්ෂර අනුව වෙන වෙනම දක්වන්න. (ල.02)


- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දක්වා ඇත. එම ප්‍රකාශ නිවැරදි නම් “නි” යන්න වටා ද වැරදි නම් “වැ” යන්න වටා ද රවුමක් අඳින්න.

(vi) උතුරු මායිමට සම්බන්ධ ජලාශයේ මැදින් වැටී ඇත්තේ දිස්ත්‍රික් මායිමකි. (නි/ වැ)

(vii) උතුරු මායිමට සම්බන්ධ කොටුකර ඇති දුනුකෝවල නම් ප්‍රදේශයේ වී වගා බිම් හෙල්මළු ක්‍රමයට වගාකර ඇත. (නි /වැ)

(ල.02)

**(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(i) සිතියමෙහි ලකුණු කොට ඇති A , B හා C යන ගංගා අතරින් "වොල්ගා" ගංගාව දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ii) සිතියමෙහි D , E හා F වලින් දක්වා ඇති කඳුවැටි අතරින් "ඇන්ඩීස්" කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක්ද?


(iii) සිතියමෙහි G , H හා J යන ගංගා නිම්න අතරින් වී වගාවට වැදගත් ප්‍රදේශයක් වූ "මිසිසිපි" ගංගා නිම්නය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iv) සිතියමේ K, L, හා M වලින් දක්වා ඇති ප්‍රදේශ අතරින් "විලිවිලිස්" නමින් හැඳින්වෙන වාසුළි බල පැවැත්වෙන ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(v) සිතියමේ P ,Q හා R අක්ෂරවලින් දැක්වෙන රටවල් අතරින් මෝටර්රථ කර්මාන්තයට ප්‍රමුඛත්වයක් දක්වන "දකුණු කොරියාව" දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ල.05)

**(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(i) සිතියමේ A , B හා C වලින් දක්වා ඇති ස්ථාන අතරින් “මීගමුව කලපුව” දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ii) සිතියමේ D , E හා F වලින් දක්වා ඇති දිස්ත්‍රික්ක අතරින් “හෙනරත්ගොඩ උද්‍යානය” දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iii) සිතියමෙහි G , H හා J යන ගංගා අතරින් “ගල්ඔය” දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iv) සිතියමෙහි K, L, හා M යන ස්ථාන අතරින් “තලාතු මිනිරන්” ඛනිජ නිධි පිහිටා ඇති ස්ථානයක් වූ “තලාතුඔය” දැක්වෙන අක්ෂරය කුමක්ද?

(v) සිතියමේ P ,Q හා R යන ජාතික උද්‍යාන අතරින් “බූන්දල” දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(ල.05)


## II කොටස

2) (i) පෘථිවි ව්‍යුහය අනුව ශිලා ගෝලය බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න. (ල.02)

(ii) ජෛව ගෝලයේ සීමාවන් ලියා දක්වන්න. (ල.03)

(iii) වර්තමානයේ මිනිස් ක්‍රියාකාරකම්වල බලපෑම නිසා ජලයේ ගුණාත්මකභාවය අඩු වේ. නිදසුන් 02ක් ඇසුරින් කෙටියෙන් පැහැදිළි කරන්න. (ල.05)

3)




(i) ඉහත සිතියමේ A හා B වලින් දැක්වෙන ලෝකයේ කිරිපට්ටි පාලනය කරන ප්‍රදේශ 02ක් නම් කරන්න. (ල.02)

(ii) ලෝකයේ කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ 03ක් නම් කරන්න. (ල.03)

(iii) (a) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ප්‍රධාන කොටස් 03කි. ඉන් 02ක් නම් කරන්න. (ල.01)

(iv) (b) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නගා සිටුවීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

4) (i) විද්‍යුත් නිෂ්පාදන කර්මාන්ත සඳහා ප්‍රචලිත

(a) නැගෙනහිර ආසියානු රටවල් 01ක් ද

(b) යුරෝපා රටවල් 01ක් ද නම් කරන්න. (ල.02)

(ii) විද්‍යුත් නිෂ්පාදන කර්මාන්ත ලෝකය පුරා වේගයෙන් ව්‍යාප්ත වීමට හා දියුණු වීමට හේතුවන කරුණු 3ක් දක්වන්න. (ල.03)

(iii) මෝටර් රථ කර්මාන්තයේ නව ප්‍රවණතා 02ක් විස්තර කරන්න. (ල.05)

5) (i) "ඛණිජයක්" යන්න අර්ථ දක්වන්න. (ල.02)

(ii) ශ්‍රී ලංකාවේ පහත ඛණිජ වර්ග ව්‍යාප්තව ඇති ප්‍රදේශ එක බැගින් නම් කරන්න.

A - සිලිකා වැලි

B - ඇපටයිට්

C - මිනිරන් (ල.03)

(iii) a. ශ්‍රී ලංකාවේ ඛණිජ සම්පත් වන මැණික් හා කෙඔලින් පදනම් කරගෙන කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත 02ක් නම් කරන්න.

මැණික්

කෙඔලින් (ල.01)

b. පෙට්‍රෝ රසායන කර්මාන්තයේ නව ප්‍රවණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.04)

6) (i) රටක සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා නූතන මිනුම් දෙකක් නම් කරන්න. (ල.02)

(ii) "මානව සම්පත් සංවර්ධනය" උදෙසා ගතයුතු ක්‍රියාමාර්ග 03ක් සඳහන් කරන්න. (ල.03)

(iii) වර්තමානය වන විට ලෝක ප්‍රජාවට "තිරසාර සංවර්ධනයක" අවශ්‍යතාවය දැඩිව පවතී. එසේ පැවසීමට හේතු වූ කරුණු 02ක් විස්තර කරන්න. (ල.05)

7) (i) ජන සංඛ්‍යාව පිළිබඳ සැලකීමේ දී ප්‍රධාන වශයෙන් වැදගත් වන ක්ෂේත්‍ර 02ක් හඳුනාගත හැකි ය. එම ක්ෂේත්‍ර 02 නම් කරන්න. (ල.02)

(ii) a. "ජන සංඛ්‍යා ස්ඵෝටනය" යනු තුමක් ද?

b. ලෝක ජන සංඛ්‍යාවේ වර්ධනය පිළිබඳ ඓතිහාසික දත්ත පිරික්සීමේ දී ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන අවධී 02ක් හඳුනා ගත හැකිය.එම අවධි 02 ලියන්න. (ල.03)

(iii)ශ්‍රී ලංකා ජන සංඛ්‍යා ව්‍යාප්තියේ ඇති අසමතුලිතභාවය අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි සාර්ථක ක්‍රියාමාර්ග 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

8) (i) ජීව විද්‍යාත්මක උපද්‍රවයක් හා දේශගුණික උපද්‍රවයක් නම් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් මහද්වීපවල පිහිටි එක් ගිනි කන්ද බැගින් නම් කරන්න.

A - උතුරු ඇමෙරිකාව

B - යුරෝපය

C - අප්‍රිකාව (ල.03)

(iii) ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ වැඩපිළිවෙළ කරුණු 03ක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

GEOGRAPHY

භූගෝල විද්‍යාව

# MARKING SCHEME - I,II

# පිළිතුරු පත්‍රය - I,II



අනුග්‍රහය :

# භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

(1) පරිවර්තී
(2) පැසිපික් භූතැටිය
(3) සානුව
(4) තිරිඟු
(5) බෝම්බුවල
(6) ආර්ථික
(7) අවසාදිත
(8) රතු කහ ලැටසෝල්
(9) 0.7
(10) වර්ග කිලෝ මීටර 1
(11) වැ
(12) නි
(13) වැ
(14) වැ
(15) නි
(16) 2 - DABC
(17) 4 - DCBA
(18) 2 - CDBA
(19) 1 - DCAB
(20) 3 - BDAC
(21) පතන ශීඝ්‍රතාවය
(22) ගල්ඔය
(23) සෞම්‍ය කලාපීය
(24) සූවස්
(25) 1000
(26) B - (කළුතර)
(27) E - (මාතලේ)
(28) D - (මහනුවර)
(29) ආජන්ටිනාව
(30) ටොන් මිලියන 28
(31) 4
(32) 2
(33) 2
(34) 2
(35) 2
(36) 2
(37) 1
(38) 2
(39) 3
(40) 2

# II පත්‍රය

## I - කොටස

1) (අ) මෙට්‍රික් සිතියම

(i) පාෂාණ උද්ගතය

හේන

සෙසු මාර්ගය

(ii) A - B අවතල බෑවුම

C - D දළ බෑවුම

(iii) රබර්

(iv) වර්ග කිලෝමීටර 05 යි.

(v) x - අක්ෂාංශ දේශාංශ

අක්ෂාංශ $7^0 25'$

දේශාංශ $80^0 35'$

y - 245 - 175 (ජාතික මෙට්‍රික් ඛණ්ඩාංක)

(vi) වැ

(vii) නි

(ආ) ලෝක සිතියම

(i) C - වොල්ගා ගග

(ii) D - අන්දීස් කඳු

(iii) H - මිසිසිපි නිම්නය

(iv) L - විලිවිලිස්

(v) R - දකුණු කොරියාව

(ඉ) ශ්‍රී ලංකා සිතියම

(i) B - මීගමුව

(ii) D - හෙනරත්ගොඩ උද්‍යානය

(iii) G - ගල්ඔය

(iv) M - තලාතු මිනිරන්

(v) R - බුන්දල

## II කොටස

(2) (i) a. පෘථිවි කබොල (earth Crust)

b. ඉහළ ප්‍රාවරණය ( upper mantle)

(ii) a. ශිලා ගෝලය - ශාකවල මුල් විහිදෙන හා පාංශු ජීවීන් වෙසෙන කොටස ( පස තුළ මීටර 2.5 පමණ)

b. ජල ගෝලය - ප්‍රභාසංස්ලේෂණය සඳහා අවශ්‍ය හිරු එළිය ලැබෙන සාගර පතුල් සීමාව

c. වායු ගෝලය - පක්ෂීන් පියාසර කරන සීමාව (දළ වශයෙන් ඉහළ අහසේ මීටර 5000 ක් පමණ)

(iii) a. කර්මාන්ත සඳහා යොදාගන්නා ජලය අපවිත්‍ර ජලය ලෙස පිට කිරීමේදි විවිධ රසායනික හා කාබනික ද්‍රව්‍යය ජලයට එක්වීම.

b. කෘෂිකර්මාන්තයේදී පසට එකතු කරන පොහොර වර්ග කෘෂි රසායනික ද්‍රව්‍ය ජලය සමග මිශ්‍ර වීම

c. මලද්‍රව්‍ය අපවහනය නිසා මතුපිට ජලාශ සහ භූගත ජලයට අපද්‍රව්‍යය එකතුවීම නිදසුන් ලෙස දැක්විය හැකිය.

(3) (i) a - ආර්ජන්ටිනාව

b – නවසීලන්තය

(ii)

* ලෝකයේ සංවර්ධිත රටවල් ව්‍යාපාරික කිරිපට්ටි පාලනයේ සියලු අංශයන්හි ප්‍රමුඛත්වය ලබාගෙන සිටීම.
* කිරි ආශ්‍රිත වෙළෙඳපොළ සංවර්ධිත රටවල් විසින් පාලනය කිරීම.
* කිරි ලබාගැනීම , ප්‍රවාහනය හා ගබඩා කිරීමේ දී මෙන් ම ලබාගන්නා කිරි ප්‍රමාණය වැඩි කිරීමට ද දියුණු ශිල්ප ක්‍රම භාවිත කිරීම.

නිදසුන් :- කිරිදෙනුන්ට හෝමෝන එන්නත් කිරීම.

ජාන තාක්ෂණය මගින් වැඩියෙන් කිරි ලබාගත හැකි දෙනුන් බෝ කිරීම.

* දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් වීම.
* චීස් , බටර් , යෝගට් වැනි කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය වැඩි වීම.

(iii) (a) 1. කරදිය ධීවර කර් මාන්තය

2. මිරිදිය ධීවර කර්මාන්තය

3. කිවුල්දිය (දෙදිය) ධීවර කර්මාන්තය

(b)

* ණය සහනාධාර ලබාදීම
* ධීවර අලෙවි සැල් ඇති කිරිම
* බහු දින ධීවර යාත්‍රා ණය / සහනාධාර යටතේ ලබා දීම
* ටින් මාලු කර්මාන්ත ශාලා ඇති කිරීම
* ධීවර ගම්මාන ඇති කිරීම
* රක්ෂණ ක්‍රම ඇති කිරිම
* නවීන තාක්ෂණය හා සන්නිවේදන ක්‍රම ඇති කිරිම
* පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම
* විශ්ව විද්‍යාල ඇති කිරීම ආදිය විස්තර කිරීම

(4) (i) (a) ජපානය / දකුණු කොරියාව / තායිවනය / චීනය

(b) බ්‍රිතාන්‍ය / ජර්මනිය / ප්‍රංශය ........ආදි රටවල්

(ii)

* දේශිය හා විදේශිය ඉල්ලුම ඉහළ යාම
* විද්‍යුත් නිෂ්පාදන අධිතාක්ෂණික උපාංග වීම
* රහැන් රහිත වීම
* වෙළෙඳපොළ තරගකාරිත්වයට ගැළපෙන පරිදි නව නිෂ්පාදන එලි දැක්වීම
* ඉතාමත් සංකීර්ණ සූක්ෂම භාණ්ඩ හා උපාංග නිෂ්පාදනය

(iii)

* නවීන තාක්ෂණික ශිල්ප ක්‍රම සහිත යාන්ත්‍රික ශ්‍රමය උපරිම ලෙස යොදා ගැනීම
* එකලස් කිරිමේ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීම
* විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම
* ශීඝ්‍රයෙන් වෙනස් වන කර්මාන්තයක් වීම
* නිෂ්පාදන අයිතිය බෝහෝ විට බහු ජාතික සමාගම් සතු වීම
* පරිසර දූෂණය අවම වන පරිදි පරිසර හිතකාමී මෝටර්රථ නිෂ්පාදනය කිරීම ........... ආදි කරුණු

(5) (i) ඛනිජ යනු ස්වාභාවිකව නිර්මාණය වන නියත රසායනික සංයුතියක් ඇති ස්ඵටික ස්වභාවයකින් යුක්ත ක්‍රමානුකූල අභ්‍යන්තර ව්‍යුහයකින් සෑදුනු අකාබනික සංඝටකයකි.

(ii) A. සිලිකා වැලි - මාරවිල / අම්පාර / වල්ලිපුරම් / මාදම්පේ

B. ඇපටයිට් - එප්පාවල

C. මිනිරන් - කහටගහ / බෝගල / රාගෙදර / කොලොන්ගහ

(iii) (a) මැණික් - ආභරණ සෑදීම / ඔරලෝසු බෙයාරින් සෑදීම / භාණ්ඩ අලංකාර කිරීම

කෙඔලින් - පිගන් නිෂ්පාදනය/ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය / සනිපාරක්ෂක උපකරණ නිෂ්පාදනය

(b)

* පෙට්‍රෝ රසායන සඳහා ඉල්ලුම ඉහලයාම.
* නිෂ්පාදන ප්‍රමාණයන් හා ආදායම ඉහල යාම.
* නාගරික ප්‍රදේශ වල ස්ථානගත වීම.
* නිෂ්පාදන භාණ්ඩ සඳහා දේශීය වෙළෙඳපල පුලුල් වීම හා වෙළෙඳපල තරගය වැඩිවීම.
* නිෂ්පාදන භාණ්ඩවල විවිධාංගීකරණයක් තිබීම.

උදා - ලිහිසි තෙල් වර්ග/ විවිධ ප්ලාස්ටික් භාණ්ඩ

(6) (i)

* භෞතික ජීවන තත්ත්ව දර්ශකය - PQLI
* මානුෂ සංවර්ධන දර්ශකය - HDI
* මානුෂ දරිද්‍රතා දර්ශකය - HPI
* මානුෂ පීඩක දර්ශකය - HPI

(ii)

* අධ්‍යාපනය, සෞඛ්‍යය, ආරක්ෂාව ආදි සේවා පහසුකම් නොමිලේ ලබා දීම
* පොදු සේවා පහසුකම් හා සුබසාධන පහසුකම් ලබා දීම
* ජනසවිය, සමෘද්ධි, දිවිනැගුම, සෞඛ්‍යය වැඩසටහන්, නිවාස සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම
* ස්වයං රැකියා අවස්ථා සඳහා ග්‍රාමීය මට්ටමේ ව්‍යාපෘති ආරම්භ කිරිම
* ග්‍රාමීය මට්ටමේ ජනතාවට විවේකය හා විනෝදය ඵලදායි ලෙස ගත කිරීමේ අවස්ථා පුලුල් කිරීම

(iii)

* ස්වාභාවික විපත් වැඩි වීම.
* දේශගුණ විපර්යාසයන් ඇති වීම.
* ජෛව සම්පත්වලට හානි සිදු වීම.
* ගෝලීය උෂ්ණත්වය වැඩි වීම.
* සම්පත් වේගයෙන් ක්ෂය වීම.
* සම්පත් හිමි කර ගැනීමේ තරඟය හේතුවෙන් පැන නැගී ඇති ගැටළු ..... ආදි කරුණු

(7) (i) 1. මිනිසාට උපතින් ම හිමි වන පුමිතිරිබව, මානව වර්ගය, වයස ආදි ලක්ෂණ

2. පසුව උරුම කර ගනු ලබන ජාතිය, ආගම, භාෂාව, සාක්ෂරතාව වැනි ලක්ෂණ

(ii) a. කෙටි කාලයක් තුළ ජනසංඛ්‍යාවේ ශීඝ්‍ර වර්ධනයක් සිදුවීම

b. 1. දීර්ඝ කාලයක් තිස්සේ මන්දගාමී වර්ධනයක් සිදුවූ අවධිය ( මානව සංහතිය ආරම්භයේ සිට 1750 පමණ දක්වා)

2. ක්‍රි.ව. 1750 පමණ සිට කෙටි නාලයක් තුළ ශීඝ්‍ර වර්ධනයක් සිදු වූ අවධිය

(iii)

* ප්‍රාදේශිය වශයෙන් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම
* මාර්ග පහසුකම් සංවර්ධනය කිරීම
* රැකියා අවස්ථා පුළුල් කිරීම
* සන්නිවේදන පහසුකම් සංවර්ධනය කිරීම
* අධ්‍යාපන පහසුකම් සංවර්ධනය කිරීම ........ ආදි මෙම කරුණු විස්තර කිරීම

(8) (i) ජීව විද්‍යාත්මක උපද්‍රව - වසංගත රෝග, ලැව්ගිනි

දේශගුණික උපද්‍රව - සුළිසුළං, අකුණු සැර, ජලගැලීම්, නියග, ලැව්ගිනි

(ii) A - උතුරු ඇමරිකාව - කට්මායි/රෙනියර්/ශාන්ත හෙලේනා

B - යුරෝපය - හෙක්ලා/ හිමෙයිසි/විසුවියස්/එට්නා

C - අප්‍රිකාව - කැමරූන්/කිලිමන්ජාරෝ

(iii)

* ආපදා කළමනාකරණය සඳහා අවශ්‍ය නව අණපනත්, නීතිරීති හා විධිමත් ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කිරීම
* ආපදා කළමනාකරණයට නව අමාත්‍යාංශයක් පිහිටුවීම
* දේශපාලන නායකත්වය සහිත ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම (NDMC)
* අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම (DMC)
* දිස්ත්‍රික්ක මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීම
* පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440